*සැ. යු.* - මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2024 වර්ෂය සඳහා ලියාපදිංචි පශු වෛද්‍යවරුන් හා වෘත්තිකයන්ගේ නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,378 - 2024 මාර්තු මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2024.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 114 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 117 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 අප්‍රේල් මස 19 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 අප්‍රේල් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

113 - B 082549- 353 (2024/03)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාතේ පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් අයි. එම්. සේනානායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1983.06.13 දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/1630 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වික්‍රමසිංහ මුදියන්සේලාගේ පුංචිබණ්ඩා වෙත ප්‍රදානය කොට නුවරඑළිය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක උහේ/8 1266/86 යටතේ 1986.09.04 දින ලියාපදිංචි කරනු ලැබ පහත උප ලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි වෙනත් අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔවුන් අනුප්‍රාප්ත වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් **2024.05.10** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගන්නෑව කෝරළේ, හඳවලපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාලිගාතැන්න, වටැස්තැන්න නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත ඔහු භාරයේ ඇති අංක 61/15/1 හා 2 දරන ක්ෂේත්‍රපත්‍රයෙහි අංක පි. පි. නු. 739 දරන පිඹුරෙහි අංක 10 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති, ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.399 ඇතැයි ගණන් බලා තිබෙන මාලිගාතැන්න යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය

| | |
|---|---|
| *උතුරට* | : පි. පි. නු. 739 සැලැස්මේ කැබලි අංක 06 සහ 01 |
| *නැගෙනහිරට* | : පි. පි. නු. 739 සැලැස්මේ කැබලි අංක 12, |
| *දකුණට* | : පි. පි. නු. 739 සැලැස්මේ කැබලි අංක 11 සහ 09, |
| *බස්නාහිරට* | : පි. පි. නු. 739 සැලැස්මේ කැබලි අංක 09 සහ 6 |

අයි. එම්. සේනානායක,
ප්‍රාදේශීය ලේකම්,
හඟුරන්කෙත

03-474/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

මධ්‍යම පළාතේ පළාත් සභාවේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් අයි. එම්. සේනානායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1982.11.25 දින ප්‍රදානය කර ඇති අංක නුඑ/ප්‍ර/577 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කුරුකුලසූරිය ලිඳමුලගේ ක්‍රිස්ටිනා ද සිල්වා වෙත ප්‍රදානය කොට නුවරඑළිය දිස්ත්‍රික් රෙජිස්ටාර් කාර්යාලයේ අංක උහේ/20/1374/86 යටතේ 1986.09.04 දින ලියාපදිංචි කරනු ලැබ පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි වෙනත් අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔවුන් අනුප්‍රාප්ත වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින්, එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් **2024.05.10** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගන්නෑව කෝරළේ, වැගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, බුළුගහපිටිය නමැති ගමේ පිහිටා ඇත්තා වූ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත ඔහු භාරයේ ඇති අංක එම්, 1/43 පි. පි. නු. 257 දරන පිඹුරෙහි අංක 7 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති, ප්‍රමාණයෙන් අක්කර 01 පර්චස් 24 ඇතැයි ගණන් බලා තිබෙන කවටයාමානපතන යනුවෙන් හඳුන්වනු ලබන පහත දැක්වෙන පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය

| | |
|---|---|
| *උතුරට* | : පි. පි. නු. 257 සැලැස්මේ කැබලි අංක 06 |
| *නැගෙනහිරට* | : පි. පි. නු. 257 සැලැස්මේ කැබලි අංක 08, |
| *දකුණට* | : පි. පි. නු. 257 කැබලි අංක 13, |
| *බස්නාහිරට* | : පි. පි. නු. 257 කැබලි අංක 05 |

අයි. එම්. සේනානායක,
ප්‍රාදේශීය ලේකම්,
හඟුරන්කෙත.

03-474/2

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

සබරගමුව පළාතේ පළාත් සභාවේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ජේ. එම්. රම්‍යා ජයසුන්දර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995.11.05 දින ප්‍රදානය කර ඇති අංක කෑ/ප්‍ර/8371 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බතලවත්ත ජනපදයේ පදිංචි ගල්ලත් රාල්ලාගේ පොඩි මැණිකේ (ජීවිත භුක්තිය) වෙත ප්‍රදානය කොට අවිස්සාවේල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඉ. සං. ආ. ට්. 17/12 යටතේ 1995.11.14 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2024.05.10** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, බුලත්කොහුපිටිය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිගම්පල්/කෝරළේ අම්පාගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ (වර්තමානයේ පනාපිටිය) උල්වල නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක කෑ. 73/258 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 41 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩමः බතලවත්ත බමුණා කොටුව

| | |
|---|---|
| *උතුරට* | : කට්ටි අංක 40 |
| *නැගෙනහිරට* | : ඩබ්ලිව්. සී. ජයවර්ධනට අයත් ඉඩම, |
| *දකුණට* | : ගෙදරවත්ත නමැති ඉඩම, |
| *බස්නාහිරට* | : කට්ටි අංක 42 |

ජේ. එම්. රම්‍යා ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම්,
බුලත්කොහුපිටිය.

2023 අගෝස්තු මස 25 වැනි දින.

03-475/1

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, ඒ. එම්. රංගන සජීව වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ, ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා විසින් 1986.02.20 දින ප්‍රදානය කර ඇති අංක කෑ. ප්‍ර. 3130 ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කුඩුමීරිය ජනපදයේ පදිංචි වඩු ආචාරිගේ ජේමිස්හාමි වෙත ප්‍රදානය කොට කෑගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO/2/198 යටතේ 1991.02.19 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය, උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධයක් ඇත්නම් එය **2024.05.10** වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### එකී උපලේඛනය

කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, වරකාපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කීරවැලි පත්තුවේ, බෙලිගල් කෝරළේ, අඹේපුස්ස ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අඹේපුස්ස නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක SUP I 23/36-44 අවසාන ගම් සිතියම් අංක පී. පී. 3907 හි කැබලි අංක 26 දරන රූඩ් 03, පර්. 34 ක් / විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම කුඩුමීරිය ජනපදය (ඉඩමේ නම)

| | |
|---|---|
| *උතුරට* | : පී. පී. 3907 හි කැබලි අංක 23, |
| *නැගෙනහිරට* | : මෙම පිඹුරේ කැබලි අංක 25 සහ ඒ ජුවානිසා සහ තවත් අය හිමිකම් කියන කුඩුමීරිය හේන, |
| *දකුණට* | : මෙම පිඹුරේ කැබලි අංක 33 සහ ඒ. ජුවානිසා සහ තවත් අය හිමිකම් කියන කුඩුමීරිය හේන, |
| *බස්නාහිරට* | : මෙම පිඹුරේ කැබලි අංක 27. |

ඒ. එම්. රංගන සජීව,
ප්‍රාදේශීය ලේකම්,

ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
වරකාපොල.

2021 මාර්තු මස 21 වැනි දින.

03-475/2

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, කේ. ජී. එස්. නිශාන්ත වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ, ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග විසින් 1995.11.30 වැනි දින ප්‍රදානය කර ඇති අංක කෑ/ප්‍ර 9987 ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගොඩපලවත්තේ පදිංචි මොහමඩ් ඊබ්‍රාහිම් අමිනා උම්මා වෙත ප්‍රදානය කොට කෑගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කෑග/8/127 යටතේ 1996.02.08 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය, උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධයක් ඇත්නම් එය **2024.05.10** දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පරණකුරු කෝරළයේ මාවත (උතුර) පත්තුවේ, 53 බී බුලුරුප්ප (මාකුර පැරණි වසම) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පරගම්මන නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් වරයා විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති මූ. පි. කෑ. 671 හි කැබලි අංක 08 දරන පර්චස් 33 ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම ගොඩපලවත්ත (ඉඩමේ නම)

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 07, |
| *නැගෙනහිරට* | : කැනවිල්ලේ ඇල, |
| *දකුණට* | : කැබලි අංක 09, |
| *බස්නාහිරට* | : ගොඩපල වත්තේ හි. පි. 193811 |

කේ. ජී. එස්. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
කෑගල්ල.

2023 නොවැම්බර් මස 18 වැනි දින.

03-475/3

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, කේ. ජී. එස්. නිශාන්ත වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ, ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග විසින් 1996.02.26 වැනි දින ප්‍රදානය කර ඇති අංක කෑ/ප්‍ර 11408 ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගොඩපලවත්තේ පදිංචි කවුඩුගම අස්සැල්ලලාගේ ජයන්ත වෙත ප්‍රදානය කොට කෑගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක කෑග/10/06 යටතේ 1997.03.17 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය, උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධයක් ඇත්නම් එය **2024.05.10** වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### එකී උපලේඛනය

කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පරණකුරු කෝරළයේ මාවත (උතුර) පත්තුවේ, 53 බී බුලුරුප්ප (මාකුර පැරණි වසම) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පරගම්මන නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, සර්වේ ජනරාල් වරයා විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති මූ. පි. කෑ. 671 හි කැබලි අංක 58 දරන රූඩ් 01 පර්චස් 09 ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම ගොඩපලවත්ත (ඉඩමේ නම)

| | |
|---|---|
| *උතුරට* | : ඇල, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 59, |
| *දකුණට* | : එච්. ඒ. ඩිංගිරි බණ්ඩාට අයත් වත්තෑවත්ත, |
| *බස්නාහිරට* | : කැබලි අංක 57. |

කේ. ජී. එස්. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
කෑගල්ල.

2023 නොවැම්බර් මස 18.

03-475/4

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනය**

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, බෝගහපිටියෙ සේරසිංහ ගමගේ රුවන්සිරි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ, අතිගරු ජනාධිපති විසින් 1997 සැප්තැම්බර් 05 දින ප්‍රදානය කර ඇති අංක රත්/ප්‍ර/44508 ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන හන්දුරුකන්ද පදිංචි දෙමටහැත්ත ගමගේ සිරිවර්ධනහාමි වෙත ප්‍රදානය කොට රත්නපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඉ.සං. 4/2434 යටතේ 1997 සැප්තැම්බර් 25 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උප ලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය, උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධයක් ඇත්නම් එය **2024.05.10** වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

**එකී උපලේඛනය**

රත්නපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩ පත්තුවේ, නවදුන් කෝරළේ, හල්පාවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හන්දුරුකන්ද නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, රත්නපුර මිනින්දෝරු අධිකාරි භාරයේ සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත ක්ෂේත්‍ර පත්‍ර අංක 5 අවසාන ගම් සිතියම් අංක 29 හි කැබලි අංක 153 දරන හෙක්ටයාර් 0.215 ක විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම පාළුපංගුව.

| | |
|---|---|
| *උතුරට* | : කැබලි අංක 156, 155, |
| *නැගෙනහිරට* | : කැබලි අංක 155, |
| *දකුණට* | : කැබලි අංක 170, |
| *බස්නාහිරට* | : කැබලි අංක 170, 156, 155. |

බී. එස්. ජී. රුවන්සිරි,
ප්‍රාදේශීය ලේකම්,
පැල්මඩුල්ල.

2022 අප්‍රේල් මස 20.

ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
පැල්මඩුල්ල.

03-478

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

**රජයේ ඉඩම් රෙගුලාසි 21 (2) යටතේ කෙරෙන නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2365 *ගැසට් පත්‍රයේ* ඉඩම් කොමසාරිස් ජෙනරාල්ගේ අංක 4/10/75807 යටතේ 2023 දෙසැම්බර් මස 29 දිනැතිව පළ කරන ලද *ගැසට් නිවේදනය* හා බැඳේ.

2024 මාර්තු මස 04 වැනි දින.

02. එහි බදුකරුට අදාළව "අ" වගන්තිය සහ "ඌ" වගන්තිය පහත පරිදි පළ වී ඇත:

 අ. බදු කාලය : අවුරුදු තිහයි (30) (2023.10.04 දින සිට වසර 30 ක් ඉදිරියට)

 ඌ. 2023.10.04 දින සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

03. එය පහත පරිදි සංශෝධනය විය යුතු බව නිවේදනය කරමි:

 අ. බදු කාලය : අවුරුදු : අවුරුදු තිහයි (30) (2023.10.24 දින සිට වසර 30 ක් ඉදිරියට)

 ඌ. 2023.10.24 දින සිට වසර 05 ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

04. එසේම එම දැන්වීමේ "අ" වගන්තිය සහ "ඌ" වගන්තිය හැර අනිකුත් කරුණු නොවෙනස්ව පවතින බවත් වැඩිදුරටත් දන්වා සිටිමි.

කේ. ජී. පී. සෞම්‍යා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2024 මාර්තු මස 04 වැනි දින,

03-459

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/74549.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : NCP/PLC/L11/04/ නොච්/දීකා

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 355, හොරුවිල ග්‍රාම නිලධාරි වසමේ හොරුවිල ගමේ ඉඩම් නිලධාරි විසින් අදින ලද NOC/LND/

CROWN/355/19 දරන දළ අනුරේඛනයේ කැබලි අංක 01 න් දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 03 රූඩ් 02 පර්චස් 24 පමණ වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා රේණුකා නිලන්ති හේරත් මිය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ:

*උතුරට* : ඇල හා රක්ෂිතය,
*නැගෙනහිරට* : විල්පත්තුව පාර,
*දකුණට* : හොරුවිල පාසල් ඉඩම,
*බටහිරට* : හොරුවිල ඇල හා රක්ෂිතය

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ:

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) ගරු ඇමතිතුමා අනුමත කළ දින සිට වසර 30 ක් ඉදිරියට

*(ආ)* *වාර්ෂික බදු මුදල*.- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන වන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* : අය නොකෙරේ,

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී පළාත් ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඇ)* පළාත් ඉඩම් කොමසාරිස්/සහකාර ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

*(උ)* ගරු ඇමතිතුමා අනුමත කරන දින සිට අවුරුදු 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරුම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එම්. එච්. ඒ. ටී. මධුශානි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 පෙබරවාරි මස 28 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
බත්තරමුල්ල රජමල්වත්ත පාර හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-465

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/32796.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : KN/ALC/M2//LTL/456 (II)

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් භාතියගම ග්‍රාම නිලධාරි වසමේ කන්තලේ භාතියගම ගමේ Tri/

KNT/2008/214 අනුරේඛනයෙහි කැබලි අංක බී හා ඊ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.3352 වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා කැන්ද වෙරළුවේ ගෙදර අමරසේන මහතා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

කැබලි අංක බී හි මායිම් -

*උතුරට* : F. T. P 2 පිඹුරේ කැබලි අංක 3749 සහ Tri/ KNT/2008/214 පිඹුරේ කැබලි අංක C ,
*නැගෙනහිරට* : Tri/KNT/2008/214 පිඹුරේ කැබලි අංක C සහ D,
*දකුණට* : Tri/KNT/2008/214 පිඹුරේ කැබලි අංක D සහ A,
*බටහිරට* : Tri/KNT/2008/214 පිඹුරේ කැබලි අංක A සහ F. T. P 2 පිඹුරේ කැබලි අංක 3749

කැබලි අංක ඊ හි මායිම් -

*උතුරට* : F. T. P 2 පිඹුරේ කැබලි අංක 3749 සහ 3770 න් කොටසක් සහ 3769 ,
*නැගෙනහිරට* : F. T. P. 2 පිඹුරේ කැබලි අංක 3769 සහ 3821,
*දකුණට* : F. T. P. 2 පිඹුරේ කැබලි අංක 3821 සහ Tri/ KNT/2008/214 පිඹුරේ කැබලි අංක A,
*බටහිරට* : Tri/KNT/2008/214 පිඹුරේ කැබලි අංක A සහ F. T. P 2 පිඹුරේ කැබලි අංක 3771

03.ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (1995.06.15 දින සිට 2025.06.14 දක්වා)

*වාර්ෂික බදු මුදල* - ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලින් 50% කට නොඅඩු විය යුතුය.

දඩ මුදල : ඉඩමේ දියුණු වටිනාකමින් 4% මෙන් තුන් ගුණයකි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

*(ඊ)* 1995.06.15 දින සිට අවුරුදු 05 ක කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(උ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* පත්‍රයේ පළ කළ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එම්. එච්. ඒ. ටී. මධුශානි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 මාර්තු මස 04 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැඳුර",
බත්තරමුල්ල රජමල්වත්ත පාර හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-466

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/32814.
*සහකාර ඉඩම් කොමසාරිස්ගේ අංකය* : KN/LTL/988B

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කන්තලේ නගරය ග්‍රාම නිලධාරි වසමේ කන්තලේ ගමේ ජනපද නිලධාරි දළ අනුරේඛනයෙහි කැබලි 3997/බී ප්‍රමාණයෙන් පර්චස් 17 ක් වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා යෝගනාත පුල්ලෙයි පරමේෂ්වරන් මහතා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

කැබලි අංක බී 3997/බී හි මායිම් -

*උතුරට* : කැබලි අංක 3995 ,
*නැගෙනහිරට* : කැබලි අංක 3996,
*දකුණට* : කැබලි අංක 3998,
*බටහිරට* : කැබලි අංක 4007 සහ 3997/ඒ.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (1995.06.15 දින සිට 2025.06.14 දක්වා)

*වාර්ෂික බදු මුදල* - ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලින් 50% කට නොඅඩු විය යුතුය.

දඩ මුදල : ඉඩමේ දියුණු වටිනාකමින් 4% මෙන් තුන් ගුණයකි.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඉ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

*(ඊ)* 1995.06.15 දින සිට අවුරුදු 05 ක කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(උ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* පත්‍රයේ පළ කළ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එම්. එච්. ඒ. ටී. මධුශානි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 මාර්තු මස 04 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
බත්තරමුල්ල රජමල්වත්ත පාර හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-467

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/32798.
*සහකාර ඉඩම් කොමසාරිස්ගේ අංකය* : KN/LTL/991 (B)

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රජඇල ග්‍රාම නිලධාරි වසමේ අග්බෝපුර ගමේ ජනපද නිලධාරි දළ අනුරේඛනයෙහි කැබලි අංක බී ප්‍රමාණයෙන් පර්චස් 30 ක් වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික  කටයුතු සඳහා පත්තිනි වසම් චමින්ද කුමාර මහතා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

*උතුරට* : අතුරු පාර ,
*නැගෙනහිරට* : තරංග ප්‍රියංකරගේ ඉඩම,
*දකුණට* : ඩබ්. වීරරත්නගේ ඉඩම,
*බටහිරට* : කැබලි අංක ඒ.

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (1995.06.15 දින සිට 2025.06.14 දක්වා)

වාර්ෂික බදු මුදල : ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලින් 50% කට නොඅඩු විය යුතුය.

දඩ මුදල : ඉඩමේ දියුණු වටිනාකමින් 4% මෙන් තුන් ගුණයකි.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

(උ) 1995.06.15 දින සිට අවුරුදු 05 ක කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරුම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එම්. එච්. ඒ. ටී. මධුශානි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 මාර්තු මස 04 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
බත්තරමුල්ල රජමල්වත්ත පාර හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-468

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/32812.
*සහකාර ඉඩම් කොමසාරිස්ගේ අංකය* : KN/LTL/983 B

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් භාතියගම ග්‍රාම නිලධාරි වසමේ, කන්තලේ ගමේ ජනපද නිලධාරි දළ අනුරේඛනයෙහි කැබලි අංක 3777/බී ප්‍රමාණයෙන් රූඩ් 01 ක් වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා ලෙනදොර ගාල ගෙදර කල්‍යාණි චන්ද්‍රලතා මිය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 3776 , |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 3777 ඉතිරි කොටස, |
| *දකුණට* | : | කැබලි අංක 3778,, |
| *බටහිරට* | : | කැබලි අංක 3777/ඒ. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (1995.06.15 දින සිට 2025.06.14 දක්වා)

වාර්ෂික බදු මුදල : ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලින් 50% කට නොඅඩු විය යුතුය.

දඩ මුදල : ඉඩමේ දියුණු වටිනාකමින් 4% මෙන් තුන් ගුණයකි.

(ආ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01 ක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

(ඇ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

(ඈ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

*(උ)* 1995.06.15 දින සිට අවුරුදු 05 ක කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරුම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* පත්‍රයේ පළ කළ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

එම්. එච්. ඒ. ටී. මධුශානි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 මාර්තු මස 04 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය, "මිහිකත මැදුර",
බත්තරමුල්ල රජමල්වත්ත පාර හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

03-469